**මොරටුව මහා නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය-**

**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 24 දින සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කල මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු විගණනයේදී නිරික්ෂණය විය.

(අ) වත්කම් අයිතම 6 ක එකතු වටිනාකම රු.20,375,561 ක් හා වගකීම් අයිතම 3 ක එකතු වටිනාකම රු.670,297 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂවලට අදාළ ගැලපීම් ප්‍රවර්තන වර්ෂය තුලදී සිදුකිරීම් නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.222,980 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමුච්චිත අරමුදල රු.11,513,563 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විථි පහන් නඩත්තු කිරිම වෙනුවෙන් විදුලි (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු රු.10,140,025 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් එම සමාගමට ලබා නොදිම සහ ප්‍රතිපූර්ණය කල නොහැකි බව 2013 දෙසැම්බර් 12 දින දක්වා තිබියදී එම මුදල ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුමේ පෙන්වා තිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මොරටුව මහා නගර සභාවට විරුද්ධව අධිකරණ 05 ක නොවිසඳී ඇති නඩු 07 ක් සම්බන්ධයෙන් සහ සභාව විසින් නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වා නොගැනීම නිසා ප්‍රධාන ජංගම ගිණුම හරහා ලබාගැනීමට සිදු වී තිබූ අයිරා පහසුකම් වෙනුවෙන් සභාව සතු රු.25,105,037 ක් වටිනා ස්ථාවර තැන්පතු ඇපයට තබා තිබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.279,105,733 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාල ශේෂයන්, ඒවාට අදාල උපයෝගි ලේඛන වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී, මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් රු.29,762,284 ක් හා අඩුවෙන් දැක්වීම් රු.13,224,968 ක් වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාන මාරුවී ගිය සේවකයින් 10 දෙනෙකුගෙන් අයවිය යුතු 645,100 ක් හා සේවය හැරගිය හා විශ්‍රාම ගිය සේවකයින් 131 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,573,424 ක ණය මුදලින් 2015 හා 2016 වර්ෂ තුළදි කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ආ) වර්ෂ 3 සිට 17 දක්වා කාලයකට අදාළ අගරු චෙක්පත් වටිනාකම රු.506,828 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 489,218 ක් වූ නිරවුල් නොකරන ලද අත්තිකාරම් ශේෂයෙන් රු. 188,402 ක් වර්ෂ 01 සිට වර්ෂ 15 දක්වා පැරණි ශේෂ විය.

(ඈ) වර්ෂ 06 කට පෙර සිට ලැබිය යුතු මුදලක් ලෙස පැවති එකතුව රු.15,569,883 ක් වූ ශේෂයන් දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඉ) ලැබිය යුතු තානායම් ගාස්තුලෙස ගිණුමේ පෙන්වාතිබූ රු. 526,500 ක වටිනාකම වර්ෂ 15 කට වඩා පැරණි ශේෂයක් විය.

(ඊ) 2001 ජනවාරි 20 දිනැති පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පලාත) අංක එල්ජී/3/2000 දරන චක්‍රලේඛය පරිදි විනෝද බදු මුදල් සියයට 10 දක්වා අඩු කිරීම සහ 2005 හා 2006 වර්ෂයට අදාල සභාවට අහිමි වූ රු 3,228,197 ක විනෝද බදු මුදලක් පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ජේදය තුල කසළ බැහැර කිරීම වෙනුවෙන් පානදුර ප්‍රදේශීය සභාවෙන් අය විය යුතු 1,303,203 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකරගෙන නොතිබුණි.

(ඖ) 1999 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල මස් වෙළඳසැල් 21 කින් අයවිය යුතු රු.642,055 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකරගෙන නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

එකතුව රු. 448,685,185 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාල ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීමෙන් මෙම ශේෂවල නිවැරදිභාවය තහවුරුකර ගැනීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | ඉදිරිපත් කල යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම නිසා රු. 1,472,582 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර එම අධිභාර වගකීමෙන් 2016 සිට 2017 වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා රු. 464,325 අධිභාර මුදලක් සභාව විසින් ගෙවා තිබුණි. |
| (ආ) | 1951 අංක 14 දරණ මෝටර් රථ පනත<br>25(1) වගන්තිය හා 99(1) වගන්තිය | වාහන 23 ක් වෙනුවෙන් ආදායම් බලපත්‍ර ද, වාහන 08 ක් වෙනුවෙන් ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ද, ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | මහා නගර සභා ආඥාපනත (252 අධිකාරිය)<br>-----------------<br>(**I**) 188 (1) උප වගන්තිය | **(i)** මෙම වගන්තියේ දැක්වෙන වියදම් ප්‍රතිපාදනයන්ගෙන් ආවරණය නොවන මහා නගර සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා සභා අරමුදලෙන් 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු. 629,690 ක් හා රු. 1,059,832 ක් ගෙවා තිබුණි.<br>**(ii)** මාසික මහා සභා රැස්වීම් සඳහා සහභාගි වන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඇඳුම් මිලදී ගැනීම සඳහා 2014 හා 2015 වර්ෂවලදී සභා අරමුදලින් ගෙවා තිබූ රු. 415,480 ක් වූ වියදම සමාලෝචිත වර්ෂය අවසානයටද අයකරගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (II) 266 (අ) වගන්තිය | කඩ කාමර දෙකකින් සභාවට ලැබිය යුතු රු. 266,400 ක හිඟ මුදල කපා හැරීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | ආයතන සංග්‍රහය<br>------------------ | |
| (i) | XIX පරිච්ඡේදය<br>4.2.1 වගන්තිය | රජයේ නිල නිවාස උපලේඛන ගත නිවාස හෝ පොදු නිවාස වශයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.<br>නිල නිවාස වෙන්කර දීම සඳහා ලකුණු දීමේ ක්‍රමයක් සකස් කර නොතිබුණි. |
| | 4.3.4 වගන්තිය | එක් එක් නිවාස ශ්‍රේණි සඳහා වෙන් වෙන්ව පොරොත්තු ලේඛණ පවත්වා නොතිබුණි. |
| | 6.1 වගන්තිය | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් නිවාස වල බදු කාලය වර්ෂ 05 කට සීමා වුවද, වර්ෂ 6 ½ සිට වර්ෂ 19 දක්වා කාලයක් නිවාස වල රැඳී සිටීමට ඉඩ දී තිබුණි. |
| | 6.1.4 වගන්තිය | නිල නිවාසයක පදිංචි නිළධාරියෙකු ස්ථාන මාරු ලබා ඉවත්වීමේදී නිල නිවාසය විධිමත් පරිදි භාරදීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | XXIV පරිච්ඡේදය<br>1.6 වගන්තිය | ස්ථාන මාරු වී ගිය සේවකයන් පස්දෙනෙකුගෙන් අයවිය යුතු රු. 440,983 ක් වූ ණය පිළිබඳව නව දෙපාර්තුමේන්තුවට දැනුම් දී නොතිබුණි. |
| | 4.1 වගන්තිය | ලබාදුන් ණය මුදල සම්පූර්ණයෙන් ආපසු අයකර නොගෙන රු. 254,290 ක ණය ලබාදී තිබුණි. |
| | 4.6 වගන්තිය | ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ අයකරගත නොහැකි ණය සම්බන්ධයෙන් අප්‍රමාදව නීතිපතිගෙන් උපදෙස් ලබාගත යුතු වූවත් එසේ ලබා ගෙන නොතිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
--------------------------

| | |
|---|---|
| (I) මු.රෙ. 128 | නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වා නොගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ දී ලබාගත් බැංකු අයිරා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,369,169 ක් අයිරා පොලී වශයෙන් ගෙවා තිබුණි. |
| (II) මු.රෙ. 156 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට කළ යුතු ගෙවීම් නියමිත වේලාවට සිදු කිරීම පැහැර හැරීම හේතුවෙන් 2015 වර්ෂයේ දී ගෙවා තිබු රු. 76,454 ක අධිභාර මුදල ඊට වගකිව යුතු අයගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (III) මු.රෙ. 261 (3) | ජංගම ගිණුමේ මුදල් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදි චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (IV) මු.රෙ. 371(2) | 2016 වර්ෂය තුළ ලබා දි තිබු රු. 53,000 අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමේදී දින 50 සිට 184 දක්වා කාල ප්‍රමාදයක් වී තිබුණි. |
| (V) මු.රෙ. 371(5) | අත්තිකාරම් ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හෝ එදිනට පෙර පියවිය යුතු නමුත් 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලබා දි තිබූ රු. 489,218 වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (VI) මු.රෙ.396 | නිකුත් කර ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 ක කාලයක් ඉකුත් වූ එකතුව රු. 39,155 ක් වටිනා චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (VII) මු.රෙ.570 හා 571 | 2016 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පත් වලින් රු. 7,662,878 ක් 2007 සිට 2014 දක්වා වූ කාල සීමාවට අදාළ ඉකුත් වූ තැන්පතු වූ නමුත්, මෙම තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (VIII) මු.රෙ. 756 | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු. 269,478,251 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් හා රු. 21,375,091ක් වන ගබඩා තොග සම්බන්ධයෙන් වර්ෂය අවසානයට තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (IX) මු.රෙ. 1645 හා 1646 | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර නොතිබුණු අතර සභාවේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් මාසික සාරාංශ පිලියෙල කර නොතිබුණි. |
| (ඊ) <u>චක්‍ර ලේඛ</u> | |
| (I) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | සභාව සතු වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (II) 2012 ජුලි 11 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) අංක WP/LGD/01/2012 දරන චක්‍රලේඛය | සැලසුම් කම්ටු කාර්යයන් සම්බන්ධයෙන් මාසික ප්‍රගති වාර්තාවක් සකස් කර එම වාර්තාව අනුගාමී මාසයේ මාසික සභා රැස්වීමට ඉදිරිපත් කර නොතිබුණි. |
| (III) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | යටත් පිරිසෙයින් පස් වසරකට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කර ගිවිසුම් යාවත්කාලීන කළ යුතු වුවද, වර්ෂ 06 සිට වර්ෂ 29 දක්වා ගිවිසුම් යාවත්කාලීන නොකළ කඩ කාමර 142 ක් විය. |

**1.3.7 අධිකාරී බලය නොලත් ගණුදෙණු**

-----------------------------------------

අවසන් ගිණුම්වල වර්ෂ ගණනාවක සිට වෙනස් නොවී දිගින් දිගටම ඉදිරියට ගෙන ආ රඳවාගැනීම් තැන්පත් හා සේවක ණය තැන්පත් ගිණුම්වල ශේෂයන්හි එකතු වටිනාකම රු.290,818 ක් නිසි හඳුනාගැනීමකින් හා නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් වලින් කපා හැර තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.65,914,271 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වැඩි වූ වියදම රු.17,040,824 ක් බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව නාගරික කොමසාරිස් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | 2016 | | | | 2015 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වර්ෂයට අදාළ හිඟය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | තථ්‍ය අයකර ගත යුතු | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 110,901 | 106,868 | 4,303 | 145,365 | 58,701 | 149,204 |
| බදු කුලී | 11,250 | 11,865 | - | - | 11,159 | 3,194 |
| බලපත්‍ර ගාස්තු | 20,504 | 20,686 | - | 2,933 | 11,083 | 54,045 |
| වෙනත් ආදායම් | 170,740 | 165,127 | 5,613 | 102,301 | 152,924 | 10,140 |
| | 313,395 | 304,547 | 9,646 | 250,599 | 233,867 | 216,583 |

#### 2.3.2 වරිපනම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ රු. 145,975,458 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි. මෙම ශේෂය තුළ රු. 50,000 ඉක්ම වූ ඒකක 131 කට අදාලව රු.61,650,608 ක ශේෂයන් අන්තර්ගත වී තිබුණි.

(ආ) 2015 හා 2016 වර්ෂයන්හිදී රු. 2,443,648 ක් වූ වරිපනම් බදු කපා හැර තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබා නොතිබුණ අතර 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සභා බල ප්‍රදේශය තුල දේපල වටිනාකම විශාල ලෙස ඉහළ ගොස් තිබුණද, 2008 වර්ෂයෙන් පසුව දේපල තක්සේරුවක් කර නොතිබුණි.

**2.3.3 කඩ කාමර කුලී**

**-----------------**

කුලී ගිවිසුම් නොමැතිව වෙළඳසැල් 46 ක් කුලියට දී තිබූ අතර එවැනි වෙළඳසැල් 18 කින් රු.442,920 ක් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව තිබූ අතර කිසිදු මාසික කුලී ගෙවීමක් කර නොතිබූ කඩ කාමර දෙකක් සඳහා බදු ගිවිසුම අනුව ක්‍රියා නොකිරීම නිසා සභාවට අහිමි වී ඇති ආදායම රු.489,600 ක් විය.

**2.3.4** කසළ බැහැර කිරීම

**------------------**

2012වර්ෂයේ සිට 2016වර්ෂය දක්වා සැහැල්ලු කුණු කසළ ඉවත් කිරීම වෙනුවෙන් සභාවට අයවිය යුතු මුදල රු.**7**,826,652 ක් වූ අතර, මෙම හිඟ මුදල තුළ රු.**50**,000 ට වඩා වැඩි ස්ථාන 30 කට අදාළ එකතු වටිනාකම රු. 3,441,300ක් විය**.**

**2.3.5** උසාවි දඩ

**-----------**

ඉකුත් වර්ෂයේ රු. 20,524,903 ක් වූ උසාවි දඩ ආදායම සියයට 97 කින් පිරිහී රු 636,839 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට බලපත්‍ර ලබාගෙන නොමැති හා 2013 වර්ෂයට ව්‍යාපාර බදු ගෙවා නොමැති ව්‍යාපාරිකයන් වෙනුවෙන් සභාව විසින් පවරා තිබූ නඩු ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් බදු නොගෙවූ ව්‍යාපාර 52 ක් හා බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන 117 කින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු හා උසාවි දඩ ආදායම් සභාවට අහිමි වී තිබුණි.

(ආ) 2012 සිට 2015 වර්ෂය දක්වා සේවකයින් 208 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් ලෙස රු.13,825,119 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත යවා තිබුණද, එම සේවකයින්ගෙන් 64 දෙනෙකු සඳහා අරමුදලේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය අයදුම්පත් ඉදිරිපත් කර අංක ලබා ගැනීමට 2016 වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(ඇ) ලුනාව තානායම පිහිටි හෙක්ටයාර් 0.7063 ක් විශාල ඉඩම මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහා නිවාස අමාත්‍යාංශය මගින් පවරා ගෙන තිබුණද, ඊට අදාළ ගිවිසුම හෝ වන්දි මුදල පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව සභාව සතු අංක 226/2026 දරණ කම්පැක්ටර් රථයක් 2010 වර්ෂයේ දී බොරලැස්ගමුව නගර සභාව වෙත නිදහස් කර තිබුණි .

### 3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ පවතින 63,265 ක දේපළ සංඛ්‍යාවක වරිපනම් ආදායම් කළමනාකරණය කිරීම සඳහා 2007 වර්ෂයේදී රු.850,556 ක් වැයකර පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදීගෙන තිබුණු අතර සේවා ගිවිසුම් සඳහා වාර්ෂිකව රු. 111,945 බැගින් ගෙවීම්කර තිබුණි. මෙකී පරිගණක මෘදුකාංගයෙන් ලබාගන්නා තොරතුරු වල පවතින විවිධ අඩුපාඩු නිවැරදි කර ගැනීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව 2014 හා 2015 වර්ෂ වලදී නිකුත්කර තිබූ බදු නියෝග අනුව රු.10,896,288 ක දඩ මුදලක් සමඟ වූ රු. 31,137,637 ක එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම 2017 මැයි 29 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඇ) රු. 1,098,723 ක් වූ අගරු චෙක්පත් වටිනාකමෙන් චෙක්පත් 90 ක් වර්ෂ 03 සිට වර්ෂ 17 දක්වා පැරණි චෙක්පත් වූ අතර එම චෙක්පත්වල වටිනාකම රු.506,828 ක් විය. එම මුදල අයකර ගැනීමට මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂය හා සැසදීමේදී ඉන්ධන දීමනා, බැංකු පොලී, කසළ ඉවත් කිරීමේ ගාස්තු හා වෙනත් වියදම් යන වියදම් විෂයයන්හී පසුගිය වර්ෂයේ රු. 22,879,333 ක්වූ වියදම සමාලෝචිත වර්ෂයේ රු. 42,219,113 දක්වා සියයට 85 කින් අසාමාන්‍ය ලෙස වැඩි වී තිබුණි.

(ඉ) මධ්‍යම වෙළඳ පොළ ගොඩනැගිල්ලේ දෙවන මහල 2010 ඔක්තෝබර් 31 දිනෙන් පසු කුලියට දීමට සභාව කටයුතු කර නොතිබුණු අතර වසර 11 ක පමණ කාලයක සිට සභාවට අයත් කිසිදු කඩ කාමර ගොඩනැගිල්ලක් හුණු පිරියම් කිරීමක් හෝ අළුත්වැඩියාවක් සභාව විසින් සිදු නොකිරීම හේතුවෙන් ඒවා ඉතා අබලන් තත්වයේ පැවතුණි.

### 3.3 ආර්ථික නොවූ ගණුදෙණු

---------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු මයික්‍රෝ වර්ගයේ රථයට ජපන් එන්ජිමක් සවි කිරීම සඳහා අළුත්වැඩියාකරු සමඟ ගිවිසුම් ගත නොවී 2014 වර්ෂයේ රු. 712,500 ක මුදලක් ගෙවා තිබූ අතර 2017 අප්‍රේල් 17 දින දක්වාත් අළුත්වැඩියා කටයුතු නිමකර වාහනය ධාවනයට යොදවා නොතිබුණි. තවද, ගලවා ඉවත් කරන ලද එන්ජිම ආපසු භාර ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් ගිලන් රථයක් විධිමත් ක්‍රමවේදයකින්, හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව මගී රථයක් බවට පරිවර්තනය කිරීම සඳහා 2015 වර්ෂයේදි රු. 1,998,500 ක් වැයකර තිබුණද, 2017 අප්‍රේල් 17 දින වන විටත් අළුත්වැඩියාව නිමකර ධාවනයට යොදා ගෙන නොතිබු අතර අළුත්වැඩියාවේදී ඉවත්කළ ගිලන් රථයට අදාළ උපාංග කිසිවක් ආපසු භාර ගෙන නොතිබුණි.

## 3.4 ඩෙංගු මර්ධන වැඩසටහන්

ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා 2016 වර්ෂයේදී රු.25,750,938 ක් වැයකර තිබුණ ද, සභා බල ප්‍රදේශය තුළ පසුගිය වර්ෂයේ 812 ක්වු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ සියයට 42 කින් වැඩි වී 1150 ක් වී තිබුණි. පසුගිය වර්ෂයේ ඩෙංගු මරණ වාර්තා වී නොතිබුණ නමුත් සමාලෝචිත වර්ෂයේ එක් මරණයක් වාර්තා වී තිබුණි. පවරන ලද නඩු සංඛ්‍යාව, නිකුත් කල රතු නිවේදන සංඛ්‍යාව යනාදිය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැඩි වී තිබුණද, මදුරුවන් බෝ විය හැකි ස්ථාන සහිත නිවාස සංඛ්‍යාව හා මදුරු කීටයන් සහිත නිවාස සංඛ්‍යාවද වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඩෙංගු මර්ධන වැඩසටහන්වලින් ඩෙංගු රෝගය පැතිරයාම වළක්වා ගැනීමට හා රෝගීන් සංඛ්‍යාව අවම කරගැනීමට අසමත්වී තිබුණි.

## 3.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) පොදු අරමුදල් ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සඳහා අයවැය මගින් වෙන්කර තිබු රු. 145,050,000 ක මුදලින් රු. 115,786,601 ක් හෙවත් සියයට 80 ක වටිනාකම වෙනුවෙන් වර්ෂය අවසානය වන විටත් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 12,376,407 ක් වූ ඇස්තමේන්තු සකස් කළ ව්‍යාපෘති 19 ක ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිම කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබු වටිනාකම රු. 14,522,412 ක්වු ව්‍යාපෘති 24 ක ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භකර නොතිබුණි.

## 3.6 පුස්තකාල සේවාව

සභාවට අයත් පුස්තකාල 09 න් එක් පුස්තකාලයක ගොඩනැගිල්ල අබලන් වීම නිසා 2015 වර්ෂයේ සිට වසා දමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී හෙළි වූ ඌණ පොත් 894 ක හා අබලි පොත් 216 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. නාගරික මන්ත්‍රීවරු සහ නිළධාරීන් රැගෙන ගිය පොත් නැවත පුස්තකාලයට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7** **හඳුනා ගත් අලාභ**

**------------------**

සභාවට අයත් කම්පැක්ටර් රථය අළුත්වැඩියා කිරීමට අදාළ ගිවිසුම් අනුව දින 85 ක් වෙනුවෙන් රු. 255,000 ක් වූ ප්‍රමාද ගාස්තු අළුත්වැඩියාකරුගෙන් අයකරගෙන නොතිබුණි.

**3.8** **වාහන උපයෝජනය**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1985 හා 2006 වර්ෂවල සභාව වෙත ලැබී තිබූ රු. 2,600,000 ක් වටිනා ගිනිරථ දෙකක් සමාලෝචිත වසර අවසානය වන විටත් ලියාපදිංචි කර නොතිබුණි.

(ආ) වාහන ඇණිය තුළ පවතින රු. 25,078,000 ක් වටිනා වාහන 11ක් හා වටිනාකම සඳහන් කර නොතිබූ වාහන තුනක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් බාහිර ආයතන නමින් ලියාපදිංචි කර තිබූ රු. 34,449,179 ක් වටිනා වාහන 6ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් කම්පැක්ටර් රථයක් ටිපර් රථයක් බවට පරිවර්තනය කර තිබූ අතර ඊට අදාළ යෝජනාව සභා රැස්වීමේදී ප්‍රතික්ෂේප කර තිබුණි. සභාව විසුරුවා හැරීමෙන් පසුව කළමණාකරණ කමිටු අනුමැතිය ගෙන අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන දෙකක මිල ගණන් ප්‍රතික්ෂේප කර කළමණාකරණ කමිටු අනුමැතියටත් මාස තුනකට කලින් ඉදිරිපත් කළ මිල කැඳවීම් පදනම් කරගෙන සභාවට සිදුවන අවාසි දායක තත්වයන් නොසළකා මොරටුව නගරයට කි.මී. 120 ක් දුරින් පිහිටි ආයතනයකට රු. 600,000කට කොන්ත්‍රාත්තුව ලබා දී මිල ගණන් කැඳවීමෙන් තොරව රු. 165,000 ක අතිරේක අළුත්වැඩියාවක්ද, එම ආයතනයටම ලබා දී තිබුණි. කම්පැක්ටර් රථය, ටිපර් රථයක් බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු. 120,000 ක මුදල පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඉ) රථ වාහන 17 කට අදාල ලොග් පොත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**3.9** **කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| ශ්‍රේණිය | 2016 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| මාණ්ඩලික | 21 | 31 | - | 10 |
| තෘතියික | 06 | 04 | 02 | - |

| | | | | |
|---|---|---|---|---|
| ද්විතීය | 233 | 203 | 30 | - |
| ප්‍රාථමික | 733 | 680 | 53 | - |
| | ------------- | ------------ | ----------- | ----------- |
| | **993** | **918** | **85** | **10** |
| | ======== | ======== | ======= | ======= |

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ස්ථිර තනතුරු වල සේවක පුරප්පාඩු 94 ක් පැවති අතර පුරප්පාඩු පවතින තනතුරුවල රාජකාරි අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිළධාරින් මඟින් ඉටු කරවා ගත්තද, අදාළ පුරප්පාඩු පිරවීමට වර්ෂය තුළ දී කටයුතු කර නොතිබුණි.

(ආ) අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීමෙන් අනතුරුව ද, මුලු පුරප්පාඩු සංඛ්‍යාව 85 ක් වී තිබුණි.

(ඇ) හදිසි අවස්ථාවක දී ඉතා අහිතකර ලෙස බලපෑහැකි, ගිනි නිවන අංශයේ වගකිව යුතු සේවා බාණ්ඩ 03 කට අයත් තනතුරු 09 ක පුරප්පාඩු පැවතුණි.

(ඈ) අනුමත කාර්ය මණ්ඩලයට අමතරව මාණ්ඩලික ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍යවරු 13 දෙනෙක් අනියම් පදනම මත ද, ද්විතීක හා ප්‍රාථමික තනතුරුවලට සේවකයන් 10 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මතද බඳවා ගෙන තිබුණි.

(ඉ) 2013 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩල ලේඛණයෙන් බෙහෙත් ශාලා, සහායක තනතුරු ඉවත් කර තිබුණ ද, සේවකයන් 08 දෙනෙකු එම තනතුරේ සේවය කරමින් තිබුණි.

(ඊ) ගරාජ් පරිපාලක හා ආදායම් භාරකරු තනතුර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන නමුත් එම තනතුරුවලට සේවකයින් දෙදෙනෙක් යොදවා තිබුණි.

(උ) ලුනාව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ස්ථිර සේවකයන් 12 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර කිසිම සේවකයෙක් සේවයේ යොදා ගෙන නොතිබුණි.

## 3.10 වත්කම් කළමණාකරණය

--------------------------

**නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) වත්කම් ලේඛණයේ ඇතුළත් රු. 36,382,958 ක් පිරිවැය වූ වාහන හා යන්ත්‍රෝපකරණ 17 ක් වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) නව ජෙනරේටරයක් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක තත්වයේ පැවති ජෙනරේටරය 2010 ජූලි 28 දින සිට භාවිතයෙන් ඉවත්කර තිබූ අතර එය සභා පරිශ්‍රය තුළ නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) සභාව සතු නිල නිවාස 6 ක් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

(ඉ) 2010 වර්ෂයේ සිට කිසිදු නිකුත් කිරීමකින් තොරව ලුනාව ව්‍යාපෘතියෙන් ලද වාහන අමතර කොටස් වර්ග 26 කට අදාලව ඒකක 154 ක් හා තවත් අයිතම වර්ග 305 කට අදාලව ඒකක 1,277 ක් කිසිදු භාවිතයකට නොගෙන ගබඩාවේ ගොඩගසා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් හා අතිරේක ඇස්තමේන්තු ලබාගැනීමෙන් අනතුරුවද, අයවැය ගත හා තත්‍ය ආදායම් සියයට 79 ක වර්ධනයේ සිට සියයට 96.6 ක අඩුවීමක් දක්වාත්, අයවැය ගත හා තත්‍ය වියදම් සියයට 2.22 සිට සියයට 69.61 දක්වාත් වැඩිවීමක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රාග්ධන ආදායමින් සියයට 79.13 ක් හා අයවැය ගත පුනරාවර්තන ආදායමින් සියයට 7.32ක් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර අයවැය ගත ප්‍රාග්ධන වියදමින් සියයට 69.1 ක් හා අයවැය ගත පුනරාවර්තන වියදමින් සියයට 9.6 ක් වර්ෂය තුළ දී උපයෝජනය කර නොතිබුණි.

(ඇ) රු. 742,000 ක ආදායමක් අපේක්ෂා කළ අය විෂයයන් 16 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණ අතර අයවැයගත රු.7,361,000 වූ පුනරාවර්තන වියදම් විෂයයන් 123 ක ද, රු. 88,630,000 ක් වූ ප්‍රාග්ධන වියදම් විෂයයන් 26 ක ද, සමාලෝචිත වර්ෂය තුළදි කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ඉලක්ක සියයට 50 ඉක්මවා සපුරා ගත නොහැකි වූ ආදායම් විෂයයන් 13 ක අපේක්ෂිත ආදායම රු. 31,642,000 ක් වුවද, තථ්‍ය ආදායම රු.6,137,138 ක් වී තිබුණි.

## 5. පද්ධති හා පාලනය

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහිද විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම්පාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය